# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 9 ශ්‍රේණිය

## ඉතිහාසය කාලය : පැය 02

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- II කොටසට අදාළ පිළිතුරු කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

### I පත්‍රය

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ලන්දේසීන් මෙරටට පැමිණියේ කුමන රටකින්ද?

1. පෘතුගාලය
2. එංගලන්තය
3. ප්‍රංශය
4. ඕලන්දය

(2) අපරාධ නඩු විසඳීමට ලන්දේසීන් පිහිටුවා තිබූ ප්‍රථම උසාවිය කුමක්ද?

1. සිවිල් රාද්
2. ලෑන් රාද්
3. රාද්වෑන් ජස්ටිට්
4. පිස්කල් උසාවි

(3) ජෝන් ඩොයිලි උඩරට ඔත්තු බැලීමේ රාජකාරිය සඳහා පත් කළේ කුමන ආණ්ඩුකාරවරයා විසින්ද?

1. තෝමස් මෙට්ලන්ඩ්
2. ෆෙඩ්රික් නෝර්ත්
3. එඩ්වඩ් බාන්ස්
4. ටොරින්ටන්

(4) ටජ්මහල ඉදි කරවූයේ කුමන රජතුමාද?

1. බාබුර් රජතුමා
2. සාජහන් රජතුමා
3. මහා අක්බාර් රජතුමා
4. ඖරන්ෂෙබ් රජතුමා

(5) මෙරට කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකිලිමත්කමින් වාරිමාර්ග ප්‍රතිසංස්කරණයට යොමු වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු හා එම වාරි මාර්ග නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. හෙන්රි වෝඩ් | A. වලවේ ගඟ සහ උඩුකිරිවල වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණ |
| 2. ආතර් ගෝඩ්න් | B. කන්තලේ වැව ප්‍රතිසංස්කරණය |
| 3. විලියම් ග්‍රෙගරි | C. වාරි කර්මාන්තය පිළිබඳ සොයා බැලීමට කාරක සභාවක් පත් කිරීම |
| 4. හර්කියුලිස් රොබින්සන් | D. තිස්සමහාරාම වැව ප්‍රතිසංස්කරණය |

1. C A B D
2. D C B A
3. D A B C
4. C B D A

(6) ඉන්දියානු සාගර කලාපයේ පෘතුගීසි බලය පැතිරවීමට මූලික වී ක්‍රියා කළ නිලධාරියා කවුද?

1. වස්කෝ ද ගාමා
2. අපොන්සෝද අල්බ්‍යුකර්ක්
3. පීටර්සර් කුන්
4. මැගලන්

(7) 1818 නිදහස් සටනේ නායකයන් ලෙස කටයුතු කලේ,

1. කඩහපොල හිමි
2. පුරන් අප්පු
3. ගොංගාලේගොඩ බණ්ඩා
4. කැප්පෙටිපොළ නිලමේ

(8) ක්‍රි. ව. 1815 දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටත්කර ගත් සමයේ මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා,

1. ෆෙඩ්රික් නෝර්ත්
2. රොබට් බ්‍රවුන්රිග්
3. තෝමස් මෙට්ලන්ඩ්
4. හෙන්රි වෝඩ්

(9) ඉන්දියාවට පැමිණි බටහිර ජාතීන් වෙරළබඩ ප්‍රදේශවල පිහිටුවාගත් වෙළෙඳ බලකොටු නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. පෘතුගීසි | A. ඔරිස්සා |
| 2. ලන්දේසි | B. පොන්ඩිච්චෙරි |
| 3. බ්‍රිතාන්‍ය | C. මද්‍රාසි |
| 4. ප්‍රංශ | D. ගෝව |

1. D A B C
2. B A C D
3. D A C B
4. D C B A

(10) 1803 දී මහනුවර නගරය අල්ලා ගත් ඉංග්‍රීසීන් උඩරට රජු ලෙස ප්‍රකාශ කළේ,

1. මුත්තුසාමි කුමාරයා
2. කන්නසාමි කුමාරයා
3. ටිකිරි කුමරු
4. මහා අස්ථාන කුමරු

- **පහත සඳහන් ප්‍රකාශන හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ප්‍රකාශය ඉදිරියෙන් යොදන්න.**

(11) කොළඹ කොමාන්ඩරිය පාලනය වූයේ වෙනම කොමදෝරුවරයෙකු යටතේ ය. (     )

(12) ලන්දේසි අධිකරණය තුළ ඉහළම උසාවිය පිස්කල් උසාවියයි. (     )

(13) සිද්ධි ලෙබ්බේ මහතා කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීමට නායකත්වය ලබා දුන් පුද්ගලයාය. (     )

(14) මංගල් පාණ්ඩේ ඉන්දියාවේ විසූ අධිරාජ්‍යයෙකි. (     )

(15) 1803 දී ඉංග්‍රීසි උඩරට ආක්‍රමණය මෙහෙය වූයේ ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාය. (     )

- **පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු වචනය වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

**(මහා අස්ථාන කුමරු, පුරන් අප්පු, III ජෝර්ජ්, ජේම්ස් ටේලර්, ජොරිස් වැන් ස්පිල්බර්ජන්)**

(16) ............................................ 1848 නිදහස් සටනේ කැපී පෙනෙන නායකයෙකි.

(17) දෙවන රාජසිංහ නමින් උඩරට රජකමට පත්වූයේ ............................................ කුමරුය.

(18) 1602 උඩරට පළමු විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි ජාතිකයා වන්නේ ............................................ ය.

(19) උඩරට ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ එංගලන්තයේ පාලකයා වූයේ ............................................ රජතුමාය.

(20) ලංකාවේ ප්‍රථම වරට තේ වගාවක් ආරම්භ කළේ ............................................ විසිනි.

(ලකුණු $2 \times 20 = 40$)

## II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(1) පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිලිතුරු පත්‍රයේ ලියන්න.

A.



i) රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?
ii) ඔහු මෙරටට පැමිණියේ කුමන රටක සිටද?
iii) එතුමාගේ කටයුතු සඳහා සහය දැක්වීමට මෙරටට පැමිණි කාන්තාව කවුද?
iv) එතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ වූ සංවිධානය කුමක්ද?

(ලකුණු 4)

B.




i) මෙම කාසිය කුමන රටකට අයත් වූවක්ද?
ii) එම රට වර්තමානයේ හඳුන්වන නම කුමක්ද?
iii) මෙම කාසි භාවිතා කළ සංවිධානය කුමක්ද?
iv) එම ජාතිකයන් මෙරටට පැමිණෙන විට උඩරට රජ කළ රජතුමා කවුද?

(ලකුණු 4)

C. පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියමේ A, B, C, D යන ස්ථාන නම් කරන්න.

A. ...........................................
B. ...........................................
C. ...........................................
D. ...........................................

(ලකුණු 4)



D. පහත දැක්වෙන සිතියමේ E, F, G, H ලෙස නම් කර ඇති ස්ථානවල නම් ලියන්න.


E. ..........................................

F. ..........................................

G. ..........................................

H. ..........................................

(ලකුණු 4)




(2)

i) පහත දැක්වෙන ගිවිසුම් ඇති කර ගත් රජවරු නම් කරන්න. (ල. 2)

A. ක්‍රි. ව. 1638 ගිවිසුම

B. ක්‍රි. ව. 1766 ගිවිසුම

ii) ලන්දේසි පාලනය යටතේ ලංකාව බෙදා තිබූ පාලන ඒකක තුනෙන් දෙකක් නම් කරන්න. (ල. 4)

iii) ලන්දේසින් ලංකාවේ සිදු කළ ආර්ථික කටයුතු උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න. (ල. 5)

(3)

i) ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනය සිදු වූ සමයේ සිද්ධීන් ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. (ල. 2)

A. බදු අය කිරීමට පත් කළ නිලධාරීන් නම් කරන්න.

B. පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළඳ සමාගමේ පාලනයට විරුද්ධව වෙරළබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසම

ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පිළිබඳ රදළ ප්‍රධානීන් අමනාපයෙන් පසු වීමට බලපෑ හේතු මොනවාද? (ල. 4)

iii) 1803 ඉංග්‍රීසි උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු විස්තර කරන්න. (ල. 5)

(4)

i) ඉංග්‍රීසීන්ට ත්‍රිකුණාමලය වරාය වැදගත් වීමට හේතු 2ක් ලියන්න. (ල. 2)

ii) රාජාධිරාජසිංහ රජුගේ අභාවයෙන් පසු උඩරට රාජ්‍යයට උරුමකම් කීමට සිටි කුමාරවරුන් දෙදෙනා කවුද? (ල. 4)

iii) උඩරට රාජධානිය යටත් කර ගැනීමේදී උපායශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ආණ්ඩුකාරවරයා කවුද? ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(5)

i) 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු 02ක් ලියන්න. (ල. 2)

ii) 1818 නිදහස් සටනේ නායකයන් හතර දෙනෙකුගේ නම් ලියන්න. (ල. 4)

iii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ල. 5)

(6)

i) ඉන්දියානු ජාතික සංගමයේ කටයුතු කළ නිලධාරීන් ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ල. 2)

A. මධ්‍යස්ථ මතධාරී නායකයෙකුගේ නමක් ලියන්න.

B. අන්තවාදී නායකයෙකුගේ නමක් ලියන්න.

ii) 1857 සිපොයි කැරැල්ල ඇති වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 4)

iii) සිපොයි කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල. 5)

(7)

i) ඉන්දියාව තුළ ඉංග්‍රීසි බලය පිහිටුවීමේදී ඉංග්‍රීසීන් අනුගමනය කළ උපායමාර්ග දෙකක් නම් කරන්න. (ල. 2)

ii) ඉන්දියානුවන් තුළ දේශානුරාගය වර්ධනය වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 4)

iii) ඉන්දියානුවන් නිදහස් සටන් ව්‍යාපාරය තුළ මහත්මා ගාන්ධිතුමා මූලිකව ක්‍රියාත්මක කළ පහත දැක්වෙන ව්‍යාපාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

A. සහයෝගිතා වර්ජනය

B. සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය